# බෞද්ධ සාහිත්‍යයෙන්

## කඳුරුදූවේ සුගතවංශ හිමි

චත්තාරො මෙ ආනන්ද ථූපාරහා, කතමෙ චත්තා-රො? තථාගතො අරහං සම්මා සම්බුද්ධො ථූපාරහො, පච්චෙක සම්බුද්ධො ථූපාරහො, තථාගත සාවකො ථූපාරහො, රාජා චක්කවත්ති ථූපාරහොති.

(දීඝනිකාය - මහා පරිනිබ්බාන සූත්‍රය)

මේ අනුව සම්මා සම්බුදුන් වහන්සේ, පසේ බුදුන් වහන්සේ, තථාගත ශ්‍රාවකයන් වහන්සේ සහ සක්විති රජතුමා යන උත්තමයන් කෙරෙහි ස්තූප සෑදිය යුතුය.

තමො තම පරායනො - තමො ජොති පරායනො
ජොති තම පරායනො - ජොති ජොති පරායනො

(අංගුත්තර නිකාය තමො තම පරායන සූත්‍රය)

අඳුරෙන් අඳුරට යන, අඳුරෙන් එළියට යන, එළියෙන් අඳුරට යන, එළියෙන් එළියට යන පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයේ විද්‍යාමාන වෙති.

පණ්ඩිතො බ්‍යත්තො මෙධාවී දීඝරත්ත
අප්පරජක්ඛජාතිකො

(මජ්ඣිම නිකාය අරියපරියෙසන සූත්‍රය)

බුදුරජාණන් වහන්සේ තම ධර්මය මුලින්ම දේශනා කිරීමට අදහස් කරනුයේ තම ප්‍රාථමික ගුරුවරුන් වූ ආලාර කාලාමට හා උද්දකරාම පුත්තටය. බුදුරදුන්ට මේ එක් එක්කෙනා පෙනෙනුයේ "පණ්ඩිත, ව්‍යක්ත, නුවණැති දිගු කලක් තිස්සේ අල්ප වූ කෙළෙසුන්ගෙන් යුතුව වෙසෙන අය ලෙසටය. මෙම විශේෂණවල ඇති වැදගත්කම නම් මේ අය එක්තරා ආකාරයක නික්ලේශී බවකින් යුතුව සිටි බව පෙනීයාම යි.

යදා බලාකා සුචිපණ්ඩරච්ඡදා
කාලස්ස මෙඝස්ස භයෙන තජ්ජිතා
පලෙහිති ආලයමාලයෙසිනී
තදා නදී අජකරණී රමෙති මං

(ථෙරගාථාපාළි - සප්පකත්ථෙර)

යම් විටෙක සුදු පියාපත් ඇති කොක් පෙළ කළු වලාකුලට බියෙන් තැතිගෙන කැදලි සොයා පැනයත් ද, එවිට අජකරණී නදිය මා සිත පිනවයි. පාඨක සිත තුළ ශාන්ත හා සහනශීලී ජනිතවීමක් විනා ප්‍රකෝපකාරී හැඟීම් ඇවිස්සීමක් මෙවැනි පද්‍ය සිය දහස් ගණනකින් වුව ද සිදුනොවේ.

නා නා කුණපසම්පුණ්ණො මහාඋක්කාරසම්භවො
චන්දනිකං ව පරිපක්කං මහාගණ්ඩො මහාවණො
පුබ්බරුහිරසම්පුණ්ණො ගූථකූපෙන ගාල්හිතො
ආපො පග්ඝරණො කායො සදා සන්දති පූතිකං

(ථෙරගාථාපාළි - කප්පත්ථෙර)

දකුම්කළු දෙය දුටු විට, එය එපරිද්දෙනුත්, පිළිකුල් කටයුතු දෙය එලෙසිනුත් වැනීම, බෞද්ධ සාහිත්‍යයේ තවත් ලක්ෂණයකි. කප්ප තෙරුන් විසින් ශරීරයේ ඇති පිළිකුල් සහගත තත්ත්වය මනාව පැහැදිලි කොට ඇත.

පරෙච න විජානන්ති මයමෙත්ථ යමාමසෙ
යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා

(ධම්මපදය - යමකවග්ගය)

(පණ්ඩිතයන් හැර) අන්‍ය වූ කලහකාර ජනයෝ මෙහි (සඟමැද) කලහ කරන්නෝ "අපි නැසෙමු (මරු වෙත යමු)" යි නොදනිත්. ඔවුන් අතුරෙහි යම් කෙනෙක් එය දනිත් ද, එයින් කලහයෝ සංසිදෙත්.

මාතා යථා නියං පුත්තං -
ආයුසා එකපුත්තමනුරක්ඛෙ
එවම්පි සබ්බ භූතෙසු -
මානසං භාවයෙ අපරිමානං

(කරණීයමෙත්ත සූත්‍රය)

මවක් එකම දරුවා තම ජීවිතය දෙවෙනි කොට ආරක්ෂා කරන්නේ යම්සේ ද, එසේම සියළුම සත්වයන් කෙරෙහි මෙත්සිත වැඩිය යුතුය.

අයඤ්ච රාමා රමණීය රූපා -
පීණොරුගණ්ඩා කුචමණ්ඩලාච
තං කාමිනිං කාමය පල්ලකඤ්ඤප -
හංසො යථා කෙසර සම්පගිද්ධො

(සමන්තකූට වර්ණනා 443)

මේ ස්ත්‍රී තොමෝ ද රමණීය කටයුතු රූප ඇත්තීය. පිරුණා වූ ඌරු ශක්තීන් හා කොපුල්තල ඇත්තීය. එසේම පිරුණු පියයුරු මඬල ඇත්තීය. හංසයෝ පිපුණු පියුම් විලකට කැමති වන්නාක් මෙන් මේ කාමිණියට කැමති වෙව) බෞද්ධ පරමාර්ථ අමතකවී කාව්‍යාලංකාර-යට මුල් තැන හිමි වී ඇත. (මෙවන් අවස්ථා නිසා) ලෞකිකත්වයට බරවූ ප්‍රවනතා මගහරවා ගැනීමට කනි-කාවත් කර ඇති බවද සඳහන් කළ යුතුය.

සචෙ ලභෙථ නිපකං සහායං -
සද්ධිං චරං සාධු විහාරී ධීරං
අභිභූය්‍ය සබ්බානි පරිස්සයානි -
චරෙය්‍ය තෙනත්තමනො සතීමා
(මහාවග්ග - කොසම්බක්ඛන්ධකය 10)

ස්ථානෝචිත ප්‍රඥ ඇති සමග හැසිරීමට සුදුසු වූ මනා විහාර ඇති නුවණැති යහළුවකු ලබන්නේ නම්, ප්‍රකට අප්‍රකට හැම උවදුරු මැඩ ඔහු සමග සතුටු සිත් ඇත්තේ හැසිරෙන්නේ ය.

කාලකා භමරවණ්ණසාදිසා -
වෙල්ලිතග්ගා මම මුද්ධජා අනු
තෙ ජරාය සාණවාකසාදිසා -
සච්චවාදිවචනං අනඤ්ඤථා
(ථෙරීගාථාපාළි - අම්බපාලිථෙරී)

(පෙර) මාගේ කේශයෝ කළුපැහැ වූවාහු බඹරුන් බඳු පැහැ ඇතිව අක්බමරු වූහ. දැන් ඔහු ජරා හේතුයෙන් සණවැහැරි බඳු වූහ. සත්‍යවාදී වූ සම්බුදුන්ගේ වචනය අන් පරිදි නොවේ.

ජීවිතයේ අස්ථිර භාවය තුළින් යථාර්ථය අවබෝධ කර ප්‍රමුදිත වූ මොහොතක්.

සුවණ්ණතා සුස්සරතා - සුසණ්ඨාන සුරූපතා
ආධිපච්ච පරිවාරං - සබ්බ මෙතෙන ලබ්භති
බද්දක නිකාය - නිධි කණ්ඩ සූත්‍රය)

සුන්දර ඡවිවර්ණ ඇති බවද, මධුර වූ ස්වර ඇති බවද, සුන්දර අඟ පසඟ සටහන් ඇති බවද, සුන්දර ශරීර ඇති බවද අධිපතිභාවය හා පිරිවර ජනයා ඇතිවීම ද යන මේ සියල්ල, මේ පුණ්‍යකර්ම නමැති නිධානය හේතු කොට ගෙන ලැබේ.

පීඨං තෙ සොවණ්ණමයං උළාරං -
මනොජවං ගච්ඡති යෙන කාමං
අලඞ්කතෙ මාල්‍යධරෙ සුවත්ථෙ -
ඔභාසසි විජ්ජුරිවබ්භකූටං
(විමානවස්තුව පීඨවර්ගය)

අලංකෘත වූ දිවසළු හැඳගත් දිවමලින් බරවූ, සැරසුණු සිරුරු ඇති එම්බා, දෙව්දුව, තීගේ රන්මය උදාර වූ පීඨය මනසට බඳු වේගයෙන් පිසිසේ යයි. තෝ විදුලිය වැළඳගත් සැදෑ වලාකුළක් මෙන් බබළව.

ඛෙත්තුපමා අරහන්තො දායකා කස්සකූපමා
බීජූපමං දෙය්‍යධම්මා - එත්තො නිබ්බත්ත තෙ ඵලං
(පේත වස්තුව - උරග වර්ගය)

රහත්හු කෙත වැනියහ. දායකයෝ ගොවියන් වැන්නාහ. දේයධර්මය (දන වස්තුව) බිජුවට වැනිය. මේ කරුණු තුන හේතුකොට ගෙන කුසල ඵලය උපදියි.

වත්තං අපරිපූරෙන්තො න සීලං පරිපූරති
අසුද්ධසීලො දුප්පඤ්ඤො චිත්තෙකග්ගං න වින්දති
වික්ඛිත්ත චිත්තො නෙකග්ගො
සම්මා ධම්ම න පස්සති
අපස්සමානො සද්ධම්මං දුක්ඛාන පරිමුච්චති
(චූල්ලවග්ග - වත්තක්ඛන්ධය)

වත් නොපුරන්නේ සිල් නොපුරයි. සිල් නැති නුවණ නැත්තා එක අරමුණක පවත්නා සිත නොලබයි. වත් නොපුරන්නාට සීලයත් - සමාධියත් නොලැබෙන බව මෙයින් කියවේ.

විසිරුනු සිත් ඇති එක අරමුණක් නැති පුද්ගලයා ධර්මය නොදකී. ධර්මය නොදන්නා දුකින් නොමිදේ.

සවෙණු වීණා සුරදුන්දුභී නභෙ
සකං සකං චාරු සරම්පමොචයුං
සපබ්බතිනුප්පුථලොක ධාතුයා
උළාර ඔභාසචයො මනොරමා
(ජින චරිතය - 107)

වස් දඬු වීණා සහිත වූ, දිව්‍ය සංගීත භාණ්ඩ අහසෙහි තම තමන්ගේ මනහර නාද විදුවාහුය. (පැවැත්වූහ) පර්වත රාජයා සහිත වූ මහත් සක්වළෙහි මනහරවූ මහත් ආලෝක සමූහයක් විය.

කොනුහාසො කිමානන්දො -
නිච්චංපජ්ජලිතෙසති
අන්ධකාරෙන ඔනද්ධා -
පදීපං න ගවෙස්සථ
(ධම්මපදය - ජරාවර්ගය)

ගිනි එකොළසකින් ඇවිලගෙන නිතොර දැවෙද්දී කුමන සිනාවක්ද? කුමන සතුටෙක්ද? නුවණ නමැති පහණ නොසොයන්නේ මන්ද? මෙවැනි අදහස්වල බලපෑම නදින්ම බෞද්ධ සාහිත්‍ය කෙරෙහි ලැබුණි.

බෞද්ධ සාහිත්‍යයෙන් දැක්වෙන ගාථාවන් වුවද ධර්මූපසංහිතවීමත් ධර්මය සුඛාවබෝධයට හිතකරවූත් අනිත්‍යාදී ප්‍රතිසංයුක්තවූත් අර්ථාන්විත වූත් ඒවා වීම අවශ්‍ය බව සඳහන් කොට ඇත.

නාච්චන්තං නිකතිප්පඤ්ඤො නිකත්‍යා සුඛ මෙධති
ආරාධෙති නිකතප්පඤ්ඤො බකො කක්කටකාම්වා'ති
(ජාතකපාළි - බක ජාතකය)

කපටි බුද්ධිය ඇති තැනැත්තා එයින් හැමදාම සැප නොලබයි. කකුළු අඬුවට බෙල්ල අසු වූ කොකා මෙන් ඔහු විපතකට ද පත් වෙයි.

යථා අත්ථංගතෙ සූරියෙ
හොන්ති සත්තා තමොගතා
එවං බුද්ධෙ අනුප්පන්නෙ
හොති ලොකො තමොගතො
(අපදානපාළි - උපාලි වර්ගය 1123)

යම් සේ සූය්‍ර්‍යයා අස්තගතවූ කල්හී සත්වයෝ අඳුරට ගියාහු වෙත්ද, එසේම බුදුරජාණන් වහන්සේ නූපන් කල්හී ලෝකයා අඳුරට ගියා වෙයි.

අවසන් වශයෙන් බෞද්ධ සාහිත්‍යය සෙසු සාහිත්‍යයෙන් ඇත් වූ ලක්‍ෂණ ප්‍රකට කිරීමට හේතු වූයේ කුමන පසුබිමක් ද යන්න ගැන ද කරුණු විමසීම වටී.

විරාගාය ධම්මො දෙසිතො නො සරාගාය
(පාරාජිකාපාළි - ප්‍රථම පාරාජිකාව 33)

මහණෙනි, සරාගය පිණිස නොව විරාගය පිණිස ම විසින් දහම් දෙසන ලදී.